www.wsws.org
# ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද කොන්ග්‍රසය ඉරාක යුද්ධයට මුදල් වෙන් කිරීම සම්බන්ධ ඩිමොක්‍රැටිකයන්ගේ යටත් වීම අනුමත කරයි

## US Congress ratifies Democratic cave-in on Iraq war funding

**පැට්‍රික් මාටින් සහ බැරී ග්‍රේ විසිනි**
**2007 මැයි 25**

ඉරාකයෙහි සහ ඇෆ්ඝනිස්ථානයෙහි යුද්ධ සඳහා තවත් ඩොලර් බිලියන 100ක් වෙන් කිරීම අනුමත කරමින් එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී මන්ඩලය හා සෙනේට් සභාව පසු ගිය බ්‍රහස්පතින්දා ඡන්දය දුන්නේ ය. ජනාධිපති බුෂ්ට ඔහු ඉල්ලා සිටි මුලු මුදල් ප්‍රමානය ම ලබා දෙනු පිනිසත් ඉරාකයෙහි මිලිටරි ප්‍රචන්ඩත්වය තව දුරටත් ඉහල නැංවීම සඳහා නිදහසේ පෙරට යාම පිනිසත් මන්ඩල දෙකේ දී ම ඩිමොක්‍රැටිකයෝ ප්‍රමානවත් ඡන්ද සංඛ්‍යාවක් සපයා දුන්හ.

මෙම පනත වනාහි නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ කතා නායකවරිය වන ඩිමොක්‍රැටික් පාක්ෂික නැන්සි පෙලොසි හා සෙනේට් සභාවේ ඩිමොක්‍රැටික් බහුතරයේ නායකයා වන හැරී රීඩ්, රිපබ්ලිකන් පාක්ෂික කොන්ග්‍රස් නායකයන් සහ ධවල මන්දිරය අතර පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයකි. ඩිමොක්‍රැටික නායකත්වය, හමුදා ඉවත් කර ගැනීමේ කාල සටහන්, බලාත්මක කල හැකි "නිර්නායක" සහ බුෂ් ගෙන යන යුද්ධය මත වෙනත් සීමාවන් පැනවීම උදෙසා වූ තමන් පූර්වයෙන් ඉදිරිපත් කල ඉල්ලීම් සියල්ල අත් හලහ.

නියෝජිත මන්ත්‍රී මන්ඩල සහ සෙනෙට් ඡන්දය විමසීම්වලට කලින් බ්‍රහස්පතින්දා උදෑසන පැවති පුවත්පත් සාකච්ඡාවක දී බුෂ් යුද්ධයට මුදල් වෙන් කිරීම පිලිබඳව වූ පනත අනුමත කලේ ය. ඔහු සිකුරාදා ඊට අත්සන් තබනු ඇතැයි අපේක්ෂිත ය.

ව්‍යවස්ථාදායකයේ මන්ඩල දෙකේ දී ම පනත් කෙටුම්පත පුලුල් පරිමාවක සහායක් දිනා ගැනීම මගින් අවධාරනය වූයේ පාලනාධිකාරය කෙරෙහි ඩිමොක්‍රැටිකයන්ගේ යටත් වීමේ තුච්ඡ ස්වභාවය යි. ඩිමොක්‍රැටිකයන් 86 දෙනෙකු පක්ෂව ඡන්දය දීමත් සමගින් නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ දී ඡන්ද 142ට 280කින් පනත සම්මත විය. "ඔව්" යනුවෙන් ඡන්දය දුන් ඩිමොක්‍රැටිකයන් අතර මන්ත්‍රී මන්ඩලය තුල බහුතරයේ නායකයා වන ස්ටෙනි හොයෙර් සහ, මන්ත්‍රී මන්ඩලය තුල සිටින ඩිමොක්‍රැටික් කන්ඩායමේ සභාපතිත්වය දරන රාහ්ම් එමානුවෙල් ද වූහ.

එරෙහිව ඡන්දය දුන්නවුන් මෙන් දෙගුනයකට වැඩි ඩිමොක්‍රැටිකයන් සංඛ්‍යාවක් "ඔව්" යනුවෙන් ඡන්දය දුන් නිසා සෙනෙට් සභාවේ දී එය 14ට 80ක් වූ අතිශය අසමතුලිත ඡන්දයකින් අනුමත විය. ඩිමොක්‍රැටික් බහුතරයේ විනය පාලක රිචර්ඩ් ඩර්බින්, සෙනෙට් විදේශ සබඳතා කමිටුවේ සභාපති සහ 2008 ජනාධිපති අපේක්ෂකත්වය සඳහා තරග වැද සිටින ජෝශප් බිඩෙන්, හා සෙනෙට් සන්නද්ධ සේවා කමිටුවේ සභාපති කාල් ලෙවින් සමග එක්ව සෙනෙට් සභාවේ සිටින ඉහල ම මට්ටමේ ඩිමොක්‍රැටිකයා වන රීඩ් " ඔව්" යැයි ඡන්දය දුනි. පනත් කෙටුම්පතට සහාය දුන් නාම මාත්‍රික ලිබරලුන් අතර මිචිගන් සෙනෙට් සභික ඩෙබී ස්ටැබිනෝ ද විය.

ඩිමොක්‍රැටික ජනාධිපති අපේක්ෂකත්වය සඳහා තරග වැද සිටින හිලරි ක්ලින්ටන්, බැරැක් ඔබාමා සහ ක්‍රිස්ටෝෆර් ඩොඩ් යන සියල්ලෝ "නැත" යැයි ඡන්දය දුන්හ. එහෙත් යම් පනතක් පිලිබඳව තමන්ට හැකි පමන විවාද කිරීමට සෙනෙට් සභිකයන්ට පවත්නා අයිතිය හෝ වෙනත් පටිපාටිමය උපක්‍රමයක් යොදා ගැනීම මගින් පනතේ ගමන් මග අවුරාලීමට ප්‍රයත්න දැරීම ප්‍රතික්ෂේප කිරීම මගින්, එනම් පැහැර හැරීම මගින් එය සම්මත කර ගැනීමට ඔවුහු ඉඩ දුන්හ.

මාස ගනනාවක යුද විරෝධී මවාපෙන්වීම්වලින් අනතුරුව බුෂ්ගේ යුද පිලිවෙතට තමන්ගේ යටත් වීම සම්පූර්න කිරීමත් සමග, "සැමරුම් දින" විරාමයට පූර්වයෙන් බුෂ් විසින් අත්සන් තබනු ඇති යුද අරමුදල් පනත් කෙටුම්පතක් සම්මත කර ගනු පිනිස ඩිමොක්‍රැටිකයෝ තමන් දුන් පොරොන්දුව ඉටු කලහ.

කොන්ග්‍රසය ක්‍රියාව, පසු ගිය නොවැම්බරයේ පැවති කොන්ග්‍රස් මැතිවරනයේ දී ප්‍රකාශයට පත් වූ ඇමරිකානු ජනතාවගේ මනෝගතීන්ට එරෙහිව යාමකි. පනත සඳහා ඡන්ද විමසීමට යන්තම් පැය කීපයකට පෙර *නිව් යෝක් ටයිම්ස්* පුවත්පතේ සහ සීබීඑස් නිව්ස් ප්‍රවෘත්ති සේවයේ මෙහෙයවීම යටතේ සිදු කල නව ජනමත විමසීමක් මගින් වාර්තාගත මට්ටමක යුද විරෝධයක් පවතින බව සොයා ගන්නා ලදි.

ජනයාගෙන් සියයට 61ක් එක්සත් ජනපදය කිසි දා ඉරාකයට මැදිහත් නො විය යුතුව තිබුනේ යැයි විශ්වාස කරන බවත් සියයට 76ක් යුද්ධය නරක අන්දමින් සිදු වෙමින් පවතින්නේ යැයි කියා සිටින බවත් සියයට 47ක් යුද්ධය "අතිශයින් ම නරක අන්දමින්" සිදු වෙමින් පවතින්නේ යැයි පෙන්වා දෙන බවත් මෙම සොයා ගැනීම් අතරට ඇතුලත් විය.

ජනයාගෙන් සියයට 63ක් ජනාධිපති බුෂ් කෙරෙහි විරුද්ධත්වය පල කල අතර ඔහු පිලිබඳව ධනාත්මක අනුමැතියක් සහිත තක්සේරුවක් ඉදිරිපත් කලේ සියයට 30ක් පමනකි. බුෂ් යුද්ධය මෙහෙයවන ආකාරය අනුමත කලේ සියයට 23ක් පමනකි. රිපබ්ලිකානුවන් බහුතරයක් ද ඇතුලුව හතරෙන් තුනකටත් වැඩි සංඛ්‍යාවක්, එනම් සියයට 76ක් කියා සිටියේ ඉරාකයට අතිරේක හමුදා " තල්ලු කර යැවීම" සඳහා වූ බුෂ්ගේ සැලසුම මගින් කිසිවක් සාක්ෂාත් කර ගැනීමට අසමමත් වනු ඇති බව යි, නැත් නම් තත්ත්වය වඩාත් නරක අතට හැරෙනු ඇති බව යි.

මහජන මතය සහ එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතයේ මනෝගතීන් අතර පවතින දැවැන්ත පරතරය එක් සංඛ්‍යා තොරතුරකින් සාරාංශ කර දැක්වේ: එනම්, ජනමත විමසීමට සහභාගි කොට ගත්තවුන්ගෙන් සියයට 63ක් කියා සිටියේ ඉරාකයෙන් හමුදා ඉවත් කර ගැනීම සඳහා එක්සත් ජනපදය 2008 වසරේ දිනයක් නියම කල යුතු බව යි.

යුද්ධය කෙරෙහි වන මෙම දැවැන්ත මහජන විරුද්ධත්වය ද ඉරාකයේ තෙල් සම්පත් පාලනය කිරීම සහ පර්සියානු බොක්ක ප්‍රදේශයේ ආධිපත්‍යය අත් කර ගැනීම සඳහා බුෂ් පාලනාධිකාරයට සහ සමස්ත එක්සත් ජනපද පාලක ප්‍රභූවට පවතින අධිෂ්ඨානය අතරින් ගමන් කිරීමට ඩිමොක්‍රැටිකයන් උත්සාහ දරා ඇත. ඉරාකයෙහි ලේ වැගිරීම දිගින් දිගට ම කර ගෙන යාම සඳහා අරමුදල් සැපයීම සම්බන්ධයෙන් බුෂ් පාලනාධිකාරය ඉල්ලා සිටින සියලු දේ ලබා දීමට ක්‍රියා කරන අතරතුරේ යුද විරෝධී ගෝසාවන් යොදා ගනිමින් මහජන මතය මුලා කිරීම සඳහා ඩිමොක්‍රැටික් කොන්ග්‍රස් නායකයන් වන රීඩ් සහ පෙලොසි ප්‍රයත්න දරා තිබේ.

කෙසේ වුව ද, ඉරාකයෙහි එක්සත් ජනපද ආක්‍රමනයට ගැඹුරින් ම විරුද්ධ වන්නා වූත් යුද්ධයට ඉක්මන් අවසානයක් ගෙන ඒමේ අරමුනින් යුතුව හය මසකට පූර්වයෙන් කොන්ග්‍රසය තුල රිපබ්ලිකානුවන් බලයෙන් පහ කිරීම සඳහා ඡන්දය දුන්නා වූත් දසලක්ෂ සංඛ්‍යාත මහජනයා ඩිමොක්‍රැටිකයන්ගේ බියගුලු යටත් වීම මගින් තව දුරටත් විරසක තත්ත්වයට ද කලකිරීමට ද පත් වනු ඇත.

නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ සාමාන්‍ය ඩිමොක්‍රැටිකයන්ට -- ඔවුන්ගෙන් බොහෝ දෙනා තේරී පත් වූයේ පසු ගිය නොවැම්බරයේ ප්‍රකාශයට පත් වූ යුද විරෝධී ඡන්දයේ චන්ඩ රැලි මාලාවල පදනම මත ය -- යම් දේශපාලන ආවරනයක් ලබා දීමේ වෑයමක් ලෙස, පෙලොසි නරුම පාර්ලිමේන්තු උපක්‍රමයක් යොදා ගත්තා ය. යුද්ධයට මුදල් වෙන් කිරීම අනුමත හෝ ප්‍රතික්ෂේප කිරීමේ තනි ඡන්දයක් වෙනුවට ඡන්ද විමසීම් දෙකක් පැවතුනි: පලමු වැන්න කැත්‍රිනා චන්ඩ මාරුතයට ගොදුරු වූවන් සඳහා ආධාර සැපයීමත් අවම වැටුප ඉහල දැමීමත් ඇතුලු දේශීය පියවරයන් සඳහා අරමුදල් වෙන් කිරීම් අනුමත කිරීමට ය. පනත් කෙටුම්පතේ එම කොටස 73ට 348ක ඡන්දයකින් සම්මත විය. දෙවන ඡන්දය හදිසි අවස්ථා සඳහා වූ අරමුදල් පිලිබඳ පනත් කෙටුම්පතේ මිලිටරිමය කොටස පිලිබඳව විය.

ප්‍රධාන වශයෙන් ම රිපබ්ලිකානුවන්ගෙන් මතු වන විරුද්ධත්වයට එරෙහිව බලගතු ඩිමොක්‍රැටික් කන්ඩායමක් දේශීය අරමුදල් සැපයීම අනුමත කරනු ඇති අතරතුරේ, සැලකිය යුතු ඩිමොක්‍රැටික් සහායක් ද ඇතිව බලගතු රිපබ්ලිකානු කන්ඩායමක් මිලිටරිමය අරමුදල් සැපයීම අනුමත කිරීම මෙම උපාය මගින් සහතික කෙරුනි. ධවල මන්දිරය සහ පනත් කෙටුම්පත නිර්මානය කල කොන්ග්‍රසයේ රිපබ්ලිකානුවන් සමග ගිවිසුම සාකච්ඡා කිරීමට උදව් කල ද තමන් මිලිටරි අරමුදල්වලට එරෙහිව ඡන්දය දෙන බවට පෙලොසි ම නිවේදනය කලා ය. එහෙත් අනතුරුව ඇය එහි ගමන් මග සහතික කල පාර්ලිමේන්තුමය ක්‍රියා පටිපාටිය අනුමත කලා ය.

නියෝජිත මන්ත්‍රී මන්ඩලය තුල රිපබ්ලිකානු පාලනය පැවති 12 වසරක කාල පරිච්ඡේදය තුල දී, ඩෙනිස් හැස්ටර්ට් වැනි මන්ත්‍රී මන්ඩලය තුල සිටි රිපබ්ලිකන් පාක්ෂික කතා නායකයෝ රිපබ්ලිකානු කන්ඩායමේ සහාය නොමැත්තේ නම් කිසිදු පනත් කෙටුම්පතක් ඡන්දයට දැමිය නොහැකි ය යන නීතිය පැනවූහ. එහි දී සමස්ත මන්ත්‍රී මන්ඩලය තුල බහුතර සහාය ඊට ලැබෙන්නේ ද නැද්ද යන කරුන නො සලකා හරින ලදි. ඩිමොක්‍රැටිකයන්ගේ සහ විරුද්ධ මතධාරී රිපබ්ලිකානුවන්ගේ සන්ධානයක් ඇති වීම තුලින් කවර හෝ පනතක් සම්මත වීම වැලැක්වීම සඳහා මෙම " බහුතරයේ බහුතරය" පිලිබඳ මූලධර්මය යලි යලිත් යොදා ගන්නා ලදි.

ගැටලු අතර වඩාත් ම වැදගත් ගැටලුව වූ යුද්ධයට මුදල් වෙන් කිරීම පිලිබඳව පැවති පලමු ප්‍රධාන ඡන්ද විමසීමට මුහුන දීමේ දී පෙලොසි විරුද්ධ ආස්ථානය ගත්තා ය. ඇ එසේ කලේ යුද්ධයට මුදල් වෙන් කිරීම පිලිබඳ පනත සඳහා රිපබ්ලිකානුවන්ගෙන් ප්‍රමානවත් තරම් විශාල වූ ඡන්ද ප්‍රමානයක් හිමි වන බව සහතික කරනු පිනිස ය.

මෙම තීන්දුව ම ගත් කල, එය ඩිමොක්‍රැටිකයන් සහ රිපබ්ලිකානුවන් අතර පවතින ප්‍රධාන වෙනසක් පෙන්නුම් කරයි. සංගත හිමි පාලක පන්තියේ අවශ්‍යතාවන් විවෘතව නියෝජනය කරන හෙයින් රිපබ්ලිකානුවෝ වඩාත් අනුකම්පා විරහිත සහ අධිෂ්ඨාන සහගත වෙති. ඩිමොක්‍රැටිකයෝ ද එලෙසින් ම ධනවත් ප්‍රභූව ආරක්ෂා කිරීමට කැප වී සිටිති. එහෙත් ද්විපක්ෂ ක්‍රමයේ දේශපාලන ඒකාධිකාරය පවත්වා ගෙන යනු පිනිස වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවන් නියෝජනය කරන බව ඇඟවීමට ඔවුන්ට සිදු වී තිබේ. මෙම පක්ෂයේ වැනෙනසුලු, උදාසීන, නිසග දෙපිටකාට්ටු ස්වභාවය ඇති වී තිබෙනුයේ මේ නිසා ය.

යුද අරමුදල් අනුමත කිරීමේ අපේක්ෂාව පිලිබඳ සන්තාපය විවෘතව ප්‍රකාශ කරමින් ද එහෙත් එක්කො "හමුදාවන්ට සහාය දැක්වීමේ" නාමයෙන් ඉරාකය තුල වඩ වඩාත් ඝාතන සිදු කිරීම සඳහා ඡන්දය දීමට හෝ නැතිනම් මුදල් වෙන් කිරීම බලාත්මක වීම සහතික කර ගැනීමට වැඩ කටයුතු කර තිබූ නායකත්වයකට සහාය දෙන අතරවාරයේ, වාර්තාමය අවශ්‍යතා වෙනුවෙන්, මුදල් සම්පාදනයට එරෙහිව ඡන්දය දීමට තමන්ට සිදු වන බව නිගමනය කරමින් ද ඩිමොක්‍රැටිකයන් සිය හැඟීම් වැල නො කැඩී ප්‍රකාශයට පත් කරන තත්ත්වයක් නියෝජිත මන්ත්‍රී මන්ඩලය තුල බ්‍රහස්පතින්දා පැවති විවාදය මගින් නිර්මානය කෙරුනි.

"මම මේ එකඟතාව පිලිකුල් කරනවා. ඒ පිලිබඳව සාකච්ඡා කලත් මම ඊට එරෙහිව ඡන්දය දෙන්න යි යන්නේ" යැයි ප්‍රකාශ කරමින් මන්ත්‍රී මන්ඩලයේ මුදල් වෙන් කිරීම් සම්බන්ධ කටයුතු පිලිබඳ සභාපති තනතුර දරන ඩේවිඩ් ඔබේ ඩිමොක්‍රැටිකයන්ගේ දෙපිටකාට්ටුකම සහ කුහකකම පිලිබඳ මනා නිදර්ශනයක් සම්පාදනය කලේ ය.

ඩිමොක්‍රැටිකයන්ගේ යටත් වීමට බුෂ් පාලනාධිකාරය දැක්වූ ප්‍රතිචාරය වූයේ ඉරාකය තුල ප්‍රචන්ඩත්වය ඉහල නැංවීමේ සිය පිලිවෙත ඔස්සේ අඛන්ඩව ඉදිරියට යාම යි. ඉරාකය තුල "විජයග්‍රහනය" අත් කර ගැනීම සඳහා වූ සිය අධිෂ්ඨානය ප්‍රකාශයට පත් කිරීමට බුෂ් රෝස උද්‍යානයේ පැවති පුවත්පත් සාකච්ඡාවකට සහභාගි විය. එක්සත් ජනපදය ඉරාකයෙන් ඉවත් වුව හොත් ඔවුන්ගේ දරුවන් ත්‍රස්තවාදීන් අතින් මරුමුවට පත් විය හැකි යැයි වාර්තාකරුවන් දෙදෙනෙකුට කියා සිටිමින්, 9/11 යලි යලිත් මතකයට නංවමින්, ඔහු භීතිය පතුරවා ලීම පිලිබඳ තමන්ගේ ප්‍රධාන උපායෙහි ම සරන පැතී ය.

එලඹෙන මාසවල දී ඉරාක වැසියන් සහ ඇමරිකානු සොල්දාදුවන් යන දෙකොට්ඨාසය අතර ම ප්‍රචන්ඩත්වය සහ මරනය ඉහල යාමක් දැක ගත හැකි වනු ඇතැයි බුෂ් එකහෙලා ම සඳහන් කලේ ය. අගෝස්තුව "ලේ වැකි" මාසයක් විය හැකි යැයි ඔහු ප්‍රකාශ කලේ ය.

යුද්ධයට මුදල් වෙන් කිරීම පිලිබඳ බුෂ්ගේ ඉල්ලීමට ඉඩ දීමත් යුද්ධය තව දුරටත් උත්සන්න කිරීමට ඔහුට නිදහස ලබා දීමත් මගින් ඩිමොක්‍රැටිකයන් අනුමැතිය දෙන්නේ මෙම තත්ත්වයට යි.

එක්සත් ජනපද ආක්‍රමනික තන්ත්‍රයට යටි වල කපතැයි සැක කෙරෙන කොටස් ඉරාක ආන්ඩුව සහ ආරක්ෂක හමුදාවන් තුලින් විරේක කොට දැමීම බඳු දේශපාලන මැදිහත් වීම් ද මිලිටරි මෙහෙයුම් ද විස්තාරනය කරමින්, ඉරාකය තුල සිටින ඉහල පෙලේ එක්සත් ජනපද අන දෙන නිලධාරීන් සහ රාජ්‍ය තාන්ත්‍රිකයන් මීලඟ 18 මාසය පුරා යුද්ධය තීව්‍ර කිරීම උදෙසා වූ සවිස්තර සැලැස්මක් කෙටුම්පත් කොට ඇති බව, මැයි 23 දා මුල් පිටුවේ පල කල ලිපියකින්, *වොෂින්ටන් පෝස්ට්* පුවත්පත වාර්තා කලේ ය.

පුවත්පතට අනුව, "එක්සත් ජනපද හමුදාවල දැන් පවතින මට්ටම මීලඟ වසර තුල දී වඩා ඉහල අගයක පවත්වා ගැනීමට සැලැස්ම පූර්වාපේක්ෂා කරයි". එයින් අදහස් වන්නේ භටයන් 160,000ක "ඉහල" මට්ටම දින නියමයක් නොමැතිව පවත්වා ගෙන යනු ඇති බව යි, ඒ සමග ඇමරිකානු හමුදා සහ ඉරාක සිවිල් ජනයා යන දෙපාර්ශ්වය අතර ම මරන සංඛ්‍යාව ඉහල යනු ඇති බව යි.

මැයි මාසය වසරේ වඩාත් ම ලේ වැකි මාසය බවට පත් වන බවක් ද ඇමරිකානුවන්ට සිදු වූ ජීවිත හෝ ශාරිරික හානිය සම්බන්ධයෙන් ගත් විට එය යුද්ධයේ ලේ වැකි ම මාසය විය හැකි බවක් ද පෙනී යයි. මැයි 22 වන අඟහරුවාදා තවත් සොල්දාදුවන් සහ මැරයින් භටයන් නව දෙනෙක් ඝාතනයට ලක් විමත් සමග මේ මාසය තුල සිදු වූ මරන සංඛ්‍යාව 81 දක්වා ඉහල නැගුනි. ඉරාකීයයන්ට සිදු වූ හානිය සම්බන්ධයෙන් ගත් කල බදාදා දිනය වසරේ වඩාත් ම නරක දිනයක් විය. බෝම්බ දැමීම්, වෙඩි තැබීම් හා වෙනත් සිදුවීම් මාලාවක් හේතු කොට ගෙන එදින 100කට වැඩි ජනයා ඝාතනයට ලක් වූ අතර 130 දෙනෙක් තුවාල ලදහ.

ඩිමොක්‍රැටික් පක්ෂයේ සහ ක්ලින්ටන් පරිපාලනයේ හිටපු නිලධරයන් විසින් පිහිටුවන ලද ලිබරල් ලොබි උද්ඝෝෂක කන්ඩායමක් වන MoveOn.org, "සෑම ඩිමොක්‍රැටිකයෙකු ම මෙම පනත් කෙටුම්පතට විරුද්ධ විය යුතු ය" යි ප්‍රකාශයට පත් කරමින් බදාදා විද්‍යුත් තැපැල මගින් අනතුරු ඇඟවීමක් නිකුත් කලේ ය. කන්ඩායමේ විධායක අධ්‍යක්ෂ එලී පැරිසර් පුවත්පත්වලට මෙසේ කියා සිටියේ යඃ "මෙය ඉතා වැදගත් ඡන්ද විමසීමක් බවට පත් වෙන්න යනවා. යුද්ධය අවසන් කිරීම ගැන අතිශය බැරෑරුම් ආකල්පයක්

ගෙන ගෙන ඇත්තේ කවුද සහ ඒ ගැන බොරු මවා පෙන්වීම් කරන්නේ කවුද යන්න එමගින් සංඥා කෙරෙනු ඇත."

සැබවින් ම, MoveOn.org හොඳින් ම දැන සිටි පරිදි, යුද අරමුදල් පනත් කෙටුම්පත පරාජයට පත් කිරීමට ක්‍රියා කරන ලෙස ඩිමොක්‍රැටික් කොන්ග්‍රස් සභිකයන්ට ආයාචනය කිරීම නිෂ්ඵල අභ්‍යාසයක් විය. යුද්ධය අවසන් කිරීම සඳහා අව්‍යාජ ලෙස කැප වන එක ම ඩිමොක්‍රැටික් කොන්ග්‍රස් සභිකයෙකු හෝ සෙනේට් සභිකයෙකු නැත. මේ සියල්ලෝ ම විවිධාකාර මවා පෙන්වීම් කරන නමුත් පෙලොසි කතා නායක ලෙසත් රීඩ් බහුතරයේ නායකයා ලෙසත් පත් කිරීමට ඡන්දය දුන්හ. එමෙන් ම අද දින නැවතත් ඔවුන් සඳහා ඡන්දය දෙනු ඇත.

පැරිසර් මෙසේ ද කී යඃ "මෙම මොහොත සම්බන්ධයෙන් පවතින ප්‍රහෙලිකාව වන්නේ දේශපාලන රැල්ල බලගතු ලෙස ඩිමොක්‍රැටිකයන් පසුපසින් පැවතීම සහ ඔවුන් සටන් වැදීම රටට අවශ්‍ය වී තිබීම යි."

MoveOn.org සහ ඒ හා සමාන ලිබරල් කන්ඩායම් සතු අලෙවි භාන්ඩ වන එබඳු ක්ෂමාලාපයන් කේන්ද්‍රීය දේශපාලන යථාර්ථය වසං කරනවා පමනකිඃ එනම්, ඩිමොක්‍රැටික් පක්ෂය යනු ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පක්ෂයකි. ඒ නිසා එය බැඳී සිටින්නේ මහජනයාගේ අභිප්‍රායන් සමග නොව එක්සත් ජනපද මූල්‍ය ප්‍රභූවේ ඉල්ලීම්වලට ය. මුසාවන්ගේ පදනම මත යුද්ධය දියත් කෙරුනේ මැද පෙරදිග තුල සහ ජාත්‍යන්තර පරිමානව මෙම පාලක ප්‍රභූවේ ආර්ථික සහ භූ-දේශපාලනික අවශ්‍යතා ප්‍රවර්ධනය කරගනු පිනිස ය.

කුමක් වුව ද, යුද්ධයට එරෙහිව පැන නැගි දැවැන්ත මහජන විරුද්ධත්වය මගින් බුෂ් යුද්ධය මෙහෙයවන ආකාරය කෙරෙහි වූ තම උපායාත්මක විරුද්ධතාවන් ඉවත් කර ගැනීමටත් ඔහු ඉල්ලා සිටින දේ ඔහුට ලබා දීමටත් ඩිමොක්‍රැටිකයන් මත දැවැන්ත පීඩනයක් ඇති කෙරින. ඩිමොක්‍රැටික් පක්ෂය එක්සත් ජනපද පාලක ප්‍රභුව මුලුමනින් කැප වී සිටින නව-විජිතවාදී යුද්ධය උදෙසා තීරනාත්මක ශක්තිය ගෙන දෙන්නා සහ පහසුකම් සපයන්නා බවට පත්ව සිටී.

© www.wsws.org